චක්‍රලේඛ අංක : 09/2022

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,
ජනපය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2022.05. 25

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

<u>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීවන නිළධාරීන් සඳහා දීමනා ගෙවීම.</u>

සමූපකාර සේවක කොමිෂන් සභා කාර්ය විධිවිධාන සංග්‍රහයේ **4.3** ඡේදය, එහි දැනට පවත්නා විධිවිධානයන් ඉවත් කොට ඒ වෙනුවට පහත විධිවිධාන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලබන බව කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

4.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීවන නිළධාරීන්ට ගෙවිය යුතු දීමනා.

පැවැත්වෙන පැය ගණන නොසලකා, සාමාන්‍ය වැඩකරන වේලාවෙන් පිටස්තරව පැවැත්වෙන එක් රැස්වීම් වාරයක් සඳහා, අදාල නිළධාරියාගේ මූලික වැටුපෙන් 2% ක් වන පරිදි දීමනාවක් ගෙවීම.

02. අංක 02/2011 චක්‍රලේඛය යටතේ දීමනා ලබා ගනු ලබන සමූපකාර සමිති වල ලේකම් වරුන් හට මෙම චක්‍රලේඛය යටතේ දීමනා ලබා ගැනීමේ හැකියාව නොමැත.

03. ඉහත සංශෝධන 2022.06.01 දින සිට ක්‍රියාත්මක වන බවත්, 04/2022 චක්‍රලේඛය එදින සිට අවලංගු කරන බවත් කොමිෂන් සභා නියමය පරිදි වැඩිදුරටත් දන්වමි.

එල්.පී. මනෝජා එස්. පතිරණ
ලේකම් (වැ.බ.)
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් : 1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. )- කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.